# කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම.

## දෙවන වාර පරීක්ෂණය 2019, මාර්තු

**13 ශ්‍රේණිය**

| සිංහල I | 71 | S | I | පැය තුනයි |
|---|---|---|---|---|

♦ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. පහත දැක්වෙන උද්ධෘත අතුරෙන් හතරක් තෝරා ගෙන ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරයම යොදා ගන්න.)

අ. ළදරුවාණෙි, යම් සේ මහත් ව ඇවිලෙන ගින්නක් දැක සත්පුරුෂ කෙනෙක් මේ ගිනි මෙ සේ ඇවිළ ඇවිළ තිබිලා ගම්වල ගෙවල වැද ගෙන ගම් ගෙවල දවා පියා නමුත් බල බලා යාම තරම් නොවන්නේ වේදැ'යි පැනක් හිස නිවා පියත් ද එ පරිද්දෙන් මාගේ සන්තානයෙහි දරු ශෝක නමැති ගින්න වැද ගෙන අදහස් නමැති ගම් ගෙවල් දවනුවා තෙපි තොපගේ අනුශාසනා නමැති පැනින් නිවා පුව. නැවත ශෝක නමැති ශරයෙන් විත් කාපු මා. තෙපි තොපගේ නුවණ නමැති අතින් සෙමෙන් සෙමෙන් ශෝක ශරය හරා පියා අනුශාසනා නමැති බෙහෙදින් අදහස් නමැති ශර පහරට බෙහෙත් කොට සුව කළව. එසේ හෙයින් තොපගේ මාලුකම පිහිටා මෙ වක් පටන් දරු සෝක නො කෙරෙමි. වියෝගය සරි වුවත් උන් ශෝක නො කරන කල මා කරන ශෝකයෙන් වන්නේ ශරීරය වියැළෙන පමණෙකැ කථාව කරන කල කාරණ නො සැලෙකෙතත් පසු ව සලකන කලට නුවණැත්තවුන්ට යහපත් ව හැඟෙයි. මටත් අනුශාසනා අසා හැම ම සැලකිණ. යම් කෙනෙක් පෙර පුරුදුකමක් නැති ව අමුතු ව ලා සහායක් වූ නම් උන් හැඳින්න මැනව.

i. මෙම ඡේදයට අනුව ළදරුවාණෙනි ලෙස ආමන්ත්‍රණය කරන්නේ කාට ද?
ii. මෙහි සඳහන් පරිදි මෙවන් පටන් දරු ශෝක නොකෙරෙමි. පැවසීමට හේතුව කුමක් ද?
iii. ''යම් කෙනෙක් පෙර පුරුදුකමක් නැතිව අමුතුවලා සහායක් වූ නම් උන් හැඳින්න මැනව.'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. මාලුකම යන්නට කෙටි විවරණය සපයන්න. (ලකුණු 4)

ආ ඉක්බිත්තෙන් සන්දවසක් මුළුල්ලෙහි කළමනා සියලු කෘත්‍යයන් නිම වූ කල සත්වන දවස් ඒ අනුරුද්ධ කුමාරයෝ ය. භද්දිය කුමාරයෝ ය. කිම්බිල නම් රාජකුමාරයෝ ය. භගු නම් රාජ කුමාරයො ය, සුප්‍රබුද්ධයන් දරු යසෝධරා දේවීන් බැහැ දෙව්දත් නම් රාජ කුමාරයෝ යයි රජකුමාරුවෝ සදෙන තම තමන්ගේ සුවහස් ගණන් ඇත්අස්රථ පාබල පිරිස් ගෙන ශක්‍ර පුරයෙන් බට දිව්‍ය භටයන් සදෙනකු සේ උයන් කෙළියට යම්හ යි නුවරින් පිටත් ව ක්‍රීඩා පසාරයෙන් යොදුන් ගණනක් පලා ගොස් එක් බිමෙක සෙනග රඳවා ඔවුනොවුන්ට හිඟිලා උපාලි නම් කපුවාණන් හා සමඟ සත් දෙන මහ සෙනගට සොරා වල් වැද වල් හිරා ගොස් පසල් දනවුවකට බැස ඔවුනොවුන් හා එක් ව මහණවම්බ යි ඔවුනොවුන් ගිවිස්වාගෙන තමන් තමන් පලන් සත්රුවන් ආභරණ ගලවා උතුරු සළුවෙක පොදිබැඳ උපාලි නම් කපුවාණන්ට දී ''මේ සියලු ආභරණ තොප සේ වූ එකක්හු එක් ජාතියක් මුළුල්ලෙහි සුඛිත ව ම ජීවිත රක්ෂා කොට ගැන්මට පමණ වන්නේ ය'' යි කියා ''තෙලෙ සම්පත් තොපට ම දුනුම්හ, අපි බුදුන් කෙරේ මහණ වන්නට යම්හ'' යි කියා රජකුමරුවෝ සදෙන නික්මුණාහ.

i. බුදුන් කෙරේ මහණ වන්නට ගිය රජ කුමරුවෝ සදෙන කවු ද?
ii. කුමාරවරු නුවරින පිටත් වූයේ කිනම් දෙස යන බව පවසමින් ද?
iii. මේ සියලු ආභරණ තොප සේ වු එකක් හු එක් ජාතියක් මුළුල්ලෙහි සුඛිතවම ජිවිත රක්ෂා කොට ගැන්මට පමණ වන්නේ ය. මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. සියලු කෘත්‍යයන් නිම වූ යන යෙදුමට කෙටි විවරණය සපයන්න. (ලකුණු 4)

ඇ. එ කල්හි උතුම් ගුණ ඇති පතිවත් වූ ඇගේ ශෝකාග්නි වේගය සුවාසූ දහසක් යොදුන් උඩ නැඟී සක්දෙව් රජුගේ භවනය හුණු කළේ ය. ශක්‍රදේවේන්ද්‍රයෝ දහසක් දිව ඇසින් ලොව බලනුවෝ මේ කාරණය දැක බමුණුවෙසක් ගෙන ඇසිල්ලෙකින් අවුත් මහබෝසතාණන් ඔත් ගල් මුඳුනෙහි පෙනී කෙණ්ඩිකාවෙන් පැන් ගෙන මහබෝසතාණන් ඇඟ ඉසලූහ. ඒ කෙණෙහි විස නැසී වණය සුව ව කොතන විදී බවත් නො දත හැකි විය. මහබෝසත් එ විට අනුන් වෙහෙසන්ට මළ වෙස් ලා වැද හොත් එකකු පරිද්දෙන් වහා නැඟී සිට සුවපත වූයේ ය. චන්ද්‍රිකා ද එ සඳ සුවපත්ව සිටි ප්‍රිය ස්වාමියා දැක බලවත් වූ සොම්නසට පැමිණ, ස්වාමිනි, යම් බඳු නුඹ වහන්සේ මාගේ ප්‍රියකල් වූ ඇඟ අමා පැන් ඉස නිදුක් කොට මාගේ එකලාකම් දුරු කොට ප්‍රිය වූ අප දෙදෙනා සමඟ කළ සේක් ද? එ සේ වූ නුඹ වහන්සේගේ ශ්‍රී පාදය වඳිමි' යි වැද හොත්තී ය. ඒ ශක්‍රදේවේන්ද්‍රයෝ ද උන් දැක බලවත් වූ සොම්නසට පැමිණ ''මෙ තැන්හි නො වසව, පර්වතයෙන් බැස මිනිසුන්ට විසය තැන නොවෙසෙව යි අවවාද කොට තමන්ගේ දිව්‍යලෝකයට ගියාහ.

i. සක් දෙව්රජුගේ භවනය හුණු වූයේ ඇයි.

ii. ශක්‍ර දේවේන්ද්‍රයෝ බමුණු වෙසක් ගෙන අවුත් කෙණ්ඩියෙන් පැන් ගෙන මහ බෝසතාණන්ගේ ඇඟට ඉසු කළ කුමක් සිදු වී ද?

iii. යම් බඳු නුඹ වහන්සේ මාගේ ප්‍රිය කල් වූ ඇඟ අමා පැන් ඉස නිදුක් කොට මාගේ එකලාකම් දුරු කොට ප්‍රිය වූ අප දෙදෙනා සමඟ කළ සේක් ද? මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

iv. ''මිනිසුන්ට විසව තැන නොවෙසෙව'' යන යෙදුමට කෙටි විවරණ සපයන්න. (ලකුණු 4)

ඈ. එම කාලයෙහි ඒ කුමාරිකාවෝ බුදුන්ගේ තුන් ලෙවුහි ව්‍යාප්ත ව සිටි නව අරහාදි වූ ගුණ ධර්මයන් සලකා යම් මල් පූජාවක් කළා හු ද ඒ කුශලකර්මයාගේ ආනුභාවයෙන් බැලූ බැලූවන්ට ඉතා ප්‍රියකරු වූ මනෝඥ වූ රූ ඇති වූහ. මේ ලෝකයෙහි යම්කිසි කෙනෙක් යම් යම් ආකාරයකින් පින් පවු දෙක ම කළාහු වී නම් ඔහු තමන් විසින් කරන ලද්දා වූ ඒ ඒ කුශලාකුශල කර්මයට සුදුසු සුදුසු පරිද්දෙන් මනෝඥ වූ නානාවර්ණ වූ මොනරුන් මෙන් එහි විපාක ලබන්නාහු මය. මයුරජාතීහු වනාහි පූර්ව ජන්මයෙහි කළ එක් අකුශලයකින් තිරිසන් යෝනියෙහි උපදනාහ. අනික් කුශල ධර්ම බලයකින් නානාවර්ණ ව ඉතා පැහැපත් වූ වර්ණාසෞන්දර්‍ය යෙන් යුක්ත වෙති. එබැවින් මොනරුන් තිරිසන් යෝනියෙහි උපදනේ අකුශල කර්මයෙන් මය, නානා වර්ණ ව නොයෙක් පැහැයෙන් යුක්ත ව රූඑත් ව උපදනේ පූර්වජන්මවල කළා වූ වෙන වෙන කුශල කර්මයෙන් මය යි මෙසේ මොනරුන්ගේ කුශලාකුශල කර්මවිභාගය මෙකී පරිද්දෙන් දත මැනවි.

i. මල් පූජාව කළ කුමාරිකාව කවුද ?

ii. මෙහි දැක්වෙන කුසලාකුසල කර්ම විභාගය පලදීම සඳහා දක්වා ඇති නිදසුන කුමක් ද?

iii. ඉතා ප්‍රියකරු වූ , මනෝඥ වූ යන්නෙහි තේරුම් ලියන්න.

iv. නම අරහාදී වූ ගුණ ධර්ම යන්නට කෙටි විවරණයක් සපයන්න. (ලකුණු )

ඉ. රස මස' වුළෙන් යුත්
වළඳා බොජුන් රසවත්
ඇඳ සොඳ සිනිඳු වත්
සඟුන් කොකුමෙන් සරා උර බිත්

මිණි කොඬොල සවනත
අඟුමිණි වළලු යුවළක
එකා වැළ උරබිත
සරා පැහැසර සළඹ සරණත

i. මෙලෙස සැරසුණේ කවුද ? කුමක් සඳහා ද?

ii. මෙහි දැක්වෙන ආභරණ නම් කරන්න.

iii. 'එකා වැළ උරබිත
සරා පැහැසර සළඹ සරණත'
යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

iv. රස මස' වුළෙන් යන්නට කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 4)

ඊ. පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධ ලියන්න.

i. ''බොහෝ දෙනා ගෙන ගිය කල කසළත් කෙරෙති. නවතාලියන් නොහැක්ක.''

ii. ''හිමි නුඹගෙන යන්නා තබා මම මා ගෙනයා නොහෙමි. මා වැනි දාවායෙක් මේ මුළු දඹදිවු තෙලෙහි නැත.''

iii. ''පළමු මෙසේ වූ නොකටයුත්ත කොට මෙසේ වූ දුකකට පැමිණියෙමි ඉනිබ්බේ පතිවුතා ධර්මය විනා මෙසේ වූ දෙයක් නොකරමි.''

iv. ඒකාන්තයෙන් වූ තමන්ගේ ගෙහිමියාණන් මළහොත් මා සමඟ වාසයට ලැබෙන්නී මය.

v. උඹලා ටවුමෙ මැක්බුල් රෙදි සාප්පුව බින්ද නේද? උඹලා සේරම පල්හොරු

vi. වංශවත් අය පතයි
සම කුලේ වන අපට

vii. එක් මහ කොටියව එහෙම පිටින්ම අතහැරලා යන්නෙ නෑ. ඌට කිට්ටුවමයි පදිංචි වෙන්නේ.

(ලකුණු 3 x 4 = 12)

උ. පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

පඩි පෙළින් බැස අයින් වී එන්න
අලුත් මල් පොකුරු අරගෙන එන්න
පින්වතුනි එන අයට ඉඩ දෙන්න
එපා පර මල් පයින් පාගන්න

බලන් මේ මල්හි පර මල් සුවඳ
කැඩුණු පෙතිවල පාබෙන මුදු මෙළෙක
මහලු මවු කෙනකුගේ මුව රැඳුණ
සිනාවක් සේ ප්‍රේමයෙන් පිරුණ

මලානික මල් රේණුවල පෙනෙන
අපරිමිත පැතුම්වල මුහුණුවර
සිය දහස් අත්වලින් පුදන ලද
උතුම් මිනිසත්කමේ ගුණ සුවඳ
බලන් තවමත් සුවඳ දෙන මහිම

පඩි පෙළින් බැස අයින් වී එන්න
තිබේ පුදසුන හිස්ව ඔබ පිණිස
අලුත් මල් පොකුරු දෝතින් ගන්න
එපා පර මල් පයින් පාගන්න

(ලකුණු 12)

02. පොදු මිනිස් දුබලතා දෙස කර්කශ නොවී උපහාසයෙන් හා හාස්‍යයෙන් යුතුව ඉදිරිපත් කිරීම ධර්මසේන හිමියන්ගේ සුවිශේෂිත්වය වේ. සද්ධර්මරත්නාවලයේ නියමිත කතා වස්තු දෙක ඇසුරින් විමසන්න.

**නැතහොත්,**

වත්මන් සමාජයේ හමුවන චරිතවල චිත්ත චෛතසික ස්වභාවය හා විවිධ මානව චර්යා ජාතක කතා තුළ නිරූපණය වේ සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

03. i. සිංහල ගද්‍ය සාහිත්‍ය ඉතිහාසය තුළ දඹදෙණි සාහිත්‍ය යුගයේ වැදගත් කෙබඳුදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii. කතා රසයත්, උපදේශයත් ඉස්මතු කොට දහම් කරුණු ගෙන හැර පෑමට සද්ධාර්මාලංකාර කතුවරයා සමත් වී ඇති ආකාරය පහදන්න.

(ලකුණු 08)

04. පසෙකින් සුමධුර වීණා නාදයකි. දෙව්ලියෝ නටති. මේ සිදුවීම් පාඨකයා ඉදිරියේ ජීවමාන කරමින් අවස්ථා නිරූපණය කිරීමට ගුත්තිල කතුවරයා යොදා ගන්නා කාව්‍යෝක්ති විමසන්න. (ලකුණු 15)

05. සොබාදහමේ බලවේග හා සමාජ බලවේග අතර දෝලනය වන මිනිසුන්ගේ ජීවිත පිළිබඳ යථාර්ථය බැද්දේගම නවකතාවෙන් නිරූපිතය. සාකච්ඡා කරන්න. (ලකුණු 15)

06. පුද්ගල බද්ධ අත්දැකීම් ඇසුරෙන් සමකාලීන සමාජය විවරණයට ලක් කර ඇති ආකාරය නියමිත කෙටි කතා තුළින් විමසුමට ලක් කරන්න. (ලකුණු 15)

07. නූතන කවියා තම කාව්‍යානුභූතිය සඳහා සංවේදී අධ්‍යාත්මික බැඳීම් සියුම් ලෙස විවරණය කරයි. නූතන පද්‍ය සංග්‍රහය ඇසුරින් නිදසුන් තුනක්වත් ඇතුළත් කරමින් අදහස් පිරික්සන්න.
(ලකුණු 15)

08. පෙමතෝ ජායති නාට්‍යයෙන් ජීවිතයේ ගැඹුරු දාර්ශනික යථාර්ථය ඉතා සරලව හා ව්‍යක්තව ඉදිරිපත් කර ඇත. විමසන්න. (ලකුණු 15)